සැ. යු. - 2024.09.13 දින පළ කරන ලද අංක 2402 *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,403 - 2024 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2024.09.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 860 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 868 |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ඔක්තෝබර් 11 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 සැප්තැම්බර් 27 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## මාතර මහා නගර සභාව

2024 පරිපූරක ඇස්තමේන්තු ලේඛනය

2024 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් ඇතුළත් පරිපූරක ඇස්තමේන්තු ලේඛනය මාතර මහා නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව සඳහා 2024.09.20 දින සිට දින හත (07) කාලයක් විවෘතව තබන බව මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 214 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

නෙලුම් ඒ. ගමගේ,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2024 අගෝස්තු මස 22 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

09-136

---

## කොළඹ මහා නගර සභාව

ගෝසාතක ආඥාපනතේ 272 අධිකාරයේ 17(1) වගන්තිය යටතේ මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් හා බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වන මා විසින් 2025 වර්ෂය තුළ මෙහි පහත පළමු වැනි ලේඛනයෙහි හා දෙවන උපලේඛනයෙහි සඳහන් දිනයන්හිදී ද, රජය විසින් විටින් විට නිකුත් කරනු ලබන නියෝග අනුව කොළඹ මහා නගර සභා ප්‍රදේශය තුළ මස් පිණිස සතුන් මැරීම, මස් විකිණීම, මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කොට තැබීම හා මස් වර්ග විකුණනු ලබන ස්ථාන විවෘත කොට තැබීම සපුරා තහනම් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

ජේ. එම්. හද්‍රානි ජයවර්ධන,
කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් හා බලතල,
කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2024 අගෝස්තු මස 31 වැනි දින,
නගර ශාලාව,
කොළඹ 07.

### පළමුවැනි උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 2025 ජනවාරි | 13 | - | දුරුතු මස පුරපසළොස්වක පෝය දිනය |
| 2025 පෙබරවාරි | 12 | - | නවම් මස පුර පසළොස්වක පෝය දිනය |
| 2025 මාර්තු | 13 | - | මැදින් මස පුර පසළොස්වක පෝය දිනය |
| 2025 අප්‍රේල් | 12 | - | බක් මස පුර පසළොස්වක පෝය දිනය |
| 2025 මැයි | 12 | - | වෙසක් මස පුර පසළොස්වක පෝය දිනය |
| 2025 මැයි | 13 | - | වෙසක් මස පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 2025 ජුනි | 10 | - | පොසොන් මස පුර පසළොස්වක පෝය දිනය |
| 2025 ජූලි | 10 | - | ඇසළ මස පුර පසළොස්වක පෝය දිනය |
| 2025 අගෝස්තු | 08 | - | නිකිණි මස පුර පසළොස්වක පෝය දිනය |
| 2025 සැප්තැම්බර් | 07 | - | බිනර මස පුර පසළොස්වක පෝය දිනය |
| 2025 ඔක්තෝබර් | 06 | - | වප් මස පුර පසළොස්වක පෝය දිනය |
| 2025 නොවැම්බර් | 05 | - | ඉල් මස පුර පසළොස්වක පෝය දිනය |
| 2025 දෙසැම්බර් | 04 | - | උඳුවප් මස පුර පසළොස්වක පෝය දිනය |

### දෙවන උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 2025 පෙබරවාරි | 04 | - | ජාතික නිදහස දිනය |
| 2025 මැයි | 01 | - | ලෝක කම්කරු දිනය |
| 2025 ඔක්තෝබර් | 04 | - | ලෝක සත්ත්ව දිනය |

09-147

**යාපනය මහ නගර සභාව**

2025 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

යාපනය මහ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන අතර, කාර්යයන් සහ ක්‍රියාකාරකම් ඉටු කරන යාපනය මහ නගර සභාවේ කොමසාරිස් චන්ද්‍රන් ක්‍රිෂ්නේන්ද්‍රන් මහතා වන මම යාපනය මහනගර සභා ආඥාපනතේ 286අ වගන්තියත් සමග කියවිය යුතු එකී පනතේ 230(1) වගන්තියේ විධිවිධාන අනුව යාපනය මහ නගර සභාවේ බල ප්‍රදේශයට 2025 වන වසර සඳහා වරිපනම් අය කිරීම පහත පරිදි විය යුතු යැයි තීරණය කරමි.

එනම්,

මහ නගර සභා ආඥාපනතේ 238 වගන්තියේ (1) උපවගන්තිය යටතේ යාපනය මහ නගර සභාවට හිමිකම් ලබා ඇති බලතල භාවිතා කොට මහනගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සියලුම නිවාස, ගොඩනැගිලි, ඉඩම් සහ ඉදිකිරීම්වල වාර්ෂික වටිනාකම, 2024 වර්ෂය සඳහා කල තක්සේරු කිරීම/තක්සේරුව 2025 වර්ෂය සඳහා තක්සේරු කිරීම/තක්සේරුවක් ලෙස සැලකිය යුතු බවත්, මෙම තක්සේරු කිරීමේ පදනම මත, මහනගර සභා ආඥාපනතේ 286(අ) වගන්තියත් සමග කියවිය යුතු එකී පනතේ 230(1) වගන්තියේ විධිවිධාන අනුව මා හට හිමිකම් ලබා දී ඇති බලතල භාවිතා කොට එකී දේපළවලින් ඉඩම් සහ නිවාස සඳහා වාර්ෂික වටිනාකමෙන් 8%ක් හා වෙළඳ මධ්‍යස්ථානවලින් වාර්ෂික වටිනාකමෙන් 10% වාර්ෂික වරිපනම් ලෙස අය කළ යුතු බවත්,

තවද, 2025 වර්ෂයේ දී පහත වගුවේ දක්වා ඇති සෑම කාර්තුවකටම අදාළව ඉදිරියෙන් සඳහන් කොට ඇති දිනයට පෙර එසේ අය කරනු ලබන වාර්ෂික වරිපනම් යාපනය මහ නගර සභාවේ අරමුදලට ගෙවිය යුතු බවත්, එලෙස වාර්ෂික වරිපනම් 2025 ජනවාරි 31 වැනි දිනට හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ගෙවන්නේ නම්, වාර්ෂික වරිපනම් මුදලින් සියයට දහයක (10%) වට්ටමක් ද, ඉහත වගුවේ සෑම කාර්තුවකටම ඉදිරියෙන් තුන්වන තීරුවේ දක්වා ඇති දිනට පෙර අදාළ වරිපනම් ප්‍රමාණය යාපනය මහ නගර සභාවේ අරමුදලට ගෙවන්නේ නම්, එම කර්තුමය මුදලින් 5% වට්ටමක් යාපනය මහ නගර සභාව විසින් ගෙවනු ලබන බවත්, අදාළ කාල සීමාව තුළ ගෙවීම් සිදු නොකළහොත්, හිස් ඉඩම් සහ නිවාස සඳහා 15% (සියයට පහළොවක්) සහ අනෙකුත් සියලුම ස්ථානවලින් 20% (සියයට විස්සක) වරෙන්තු ගාස්තුවක් අය කළ යුතු බවටත් මම තීරණය කරමි.

වගුව

| | *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටමක් ලබාගත හැකි අවසන් දිනය* |
|---|---|---|---|
| 01 | පළමු කාර්තුව | 2025.01.01 - 2025.03.31 | 2025.01.31 |
| 02 | දෙවන කාර්තුව | 2025.04.01 - 2025.06.30 | 2025.04.30 |
| 03 | තෙවන කාර්තුව | 2025.07.01 - 2025.09.30 | 2025.07.31 |
| 04 | සිව්වන කාර්තුව | 2025.10.01 - 2025.12.31 | 2025.10.31 |

චන්ද්‍රන් ක්‍රිෂ්නේන්ද්‍රන්,
කොමසාරිස්.
මහ නගර සභාව.
යාපනය.

09-134

## උඩපළාත ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

2024.05.17 දිනැති අංක 2385 ගැසට් පත්‍රයේ IV(ආ) කොටසෙහි ප්‍රසිද්ධ කිරීමට යෙදුණ පහත මාර්ග සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කිරීමට පනවා තිබූ කාල සීමාව තුළ කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් වී නොමැති හෙයින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව උපලේඛනයේ සඳහන් මාර්ග, මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය සභාව විසින් එම මාර්ග, ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පිඹුරුපත -මිනින්දෝරු ආර්. එස්. පතිරණ මයා විසින් මැන අඳින ලද අංක 4004 හා 4004B දරන පිඹුරුපත්

එස්. එම්. කේ. ජී. එස්. සුබසිංහ,
ලේකම්,
උඩපළාත ප්‍රාදේශීය සභාව.


2023 අගෝස්තු මස 10 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය සභාව,
දැල්පිටිය, අටබාගේ දී ය.


| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | පිඹුරු පත් අංකය | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | මිල්ලගහමුල සිට කාසල් මිල්ක් හන්දිය දක්වා පාර | මිල්ලගහමුල හන්දිය ගුණතිලක ස්ටෝර්ස් අසලින් | කාසල් මිල්ක් හන්දිය | 1. ඩබ්. ජී. ජී. ගුණතිලක මයා හිමිකම් කියන ඉඩම - ගුණතිලක ස්ටෝර්ස්<br>2. එන්. ජී. බණ්ඩාර මයා හා තවත් අය හිමිකම් කියන ඉඩම<br>3. ඩබ්. ජී. ඒ. රත්නසිංහ මයා හිමිකම් කියන ඉඩම<br>4. ඩබ්. එන්. බණ්ඩාර මයා සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>5. ප්‍රියන්ත වික්‍රමසිංහ මයා හිමිකම් කියන ඉඩම<br>6. ඩී. එම්. එන්. පණ්ඩුලරත්න මයා හිමිකම් කියන ඉඩම<br>7. ඩී. ජී. පණ්ඩුලරත්න මයා හිමිකම් කියන ඉඩම<br>8. ඩබ්. ජී. මාටින් මයා හා උරුමකරුවන් හිමිකම් කියන ඉඩම<br>9. යූ. බී. ඉන්දික සමන් කුමාර මයා හිමිකම් කියන ඉඩම | 1. නිහාල් රූපටි ජයසූරිය මයා හිමිකම් කියන ඉඩම<br>2. කාසල් මිල්ක් උඩ පාර (තේවත්ත දෙසට)<br>3. ප්‍රේමා මිය හිමිකම් කියන ඉඩම<br>4. පී. කේ. එන්. ජී. ටී. බී. නීලවල මයා හිමිකම් කියන ඉඩම<br>5. රණසිංහ මයා සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>6. ඊ. ජී. ගුණදාස මහතා හිමිකම් කියන ඉඩම<br>7. වී. ඒ. ඉන්දික රුක්මාල් මයා හිමිකම් කියන ඉඩම<br>8. ඩී. ජී. චන්ද්‍රාවතී මිය හිමිකම් කියන ඉඩම<br>9. ඩී. ජී. සුමනදාස මයා සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>10. ඩී. ජී. ලයනල් හරිස්චන්ද්‍ර මයා හිමිකම් කියන ඉඩම | 4004 | 1725 | අවමය අඩි 15 සිට පිඹුරේ දක්වා ඇති පරිදි |

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | පිඹුරු පත් අංකය | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 10. ඩබ්. ඒ. නිහාල් තිලකරත්න මයා හිමිකම් කියන ඉඩම<br>11. රූපා වසන්ති මිය හිමිකම් කියන ඉඩම<br>12. එම්. ජී. බේබි නෝනා මිය හිමිකම් කියන ඉඩම<br>13. ඩබ්. ජී. සෝමරත්න මයා හිමිකම් කියන ඉඩම<br>14. ඩබ්. ජී. සිරිපාල මයා හිමිකම් කියන ඉඩම<br>15. එච්. ජී. ජයතිලක මයා හිමිකම් කියන ඉඩම<br>16. එච්. ජී. සිරිසේන මයා හිමිකම් කියන ඉඩම<br>17. එච්. ජී. මල්ලිකා මිය හිමිකම් කියන ඉඩම<br>18. ඊ. එම්. ටිකිරි මැණිකේ මිය සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>19. මිල්ලගහමුල දෙසට ගොවි සෙවන මාර්ගය<br>20. යූ. ජී. එම්. සුනිල් ශාන්ත මයා හිමිකම් කියන ඉඩම<br>21. කාසල් මිල්ක් බංගලාවට යන පාර<br>22. කාසල් මිල්ක් තේ වත්ත | 11. කටුපදුරේමඩ ගම අසලින් එකේ කැල්ලට යන පාර<br>12. බුදු මැදුර<br>13. ඩී. ජී. සුමනසිරි මයා හිමිකම් කියන ඉඩම<br>14. කේ. සමන් කුමාර කොළඹගේ මයා සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>15. ඩබ්. ජී. ජයසේන මයා හිමිකම් කියන ඉඩම<br>16. ආර්. ජී. සිරිවර්ධන මයා හිමිකම් කියන ඉඩම<br>17. වයි. ජී. කුසුමාවතී මිය හිමිකම් කියන ඉඩම<br>18. ආර්. ජී. චන්ද්‍රපාල මයා හිමිකම් කියන ඉඩම<br>19. ඩී. ජී. තිලකරත්න මයා හිමිකම් කියන ඉඩම<br>20. ඊ. එම්. ටිකිරිමැණිකේ මිය සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>21. කාසල් මිල්ක් තේ කර්මාන්ත ශාලාව පිහිටි තේ ඉඩම<br>22. එම්. එම්. රේණුකා දමයන්ති මිය සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>23. කාසල් මිල්ක් තේ වත්ත | | | |

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | පිඹුරු පත් අංකය | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | කාසල් මිල්ක් ගොවි සෙවන පාර | මිල්ලගහමුල සිට කාසල් මිල්ක් හන්දිය දක්වා පාර | ග්‍රෝව් හිල් සිට මිල්ලගහ මුල දක්වා යන ප්‍රාදේශීය සභා පාර | 1. ඊ. එම්. ටිකිරි මැණිකේ මිය සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>2. ප්‍රියන්ත මයා හිමිකම් කියන ඉඩම<br>3. බී. ඩබ්. සෝමාවතී මිය හිමිකම් කියන ඉඩම<br>4. ශාන්ත නවරත්න මයා හිමිකම් කියන ඉඩම<br>5. සෙනවිරත්න මයා හිමිකම් කියන ඉඩම<br>6. කරුණාරත්න මයා හිමිකම් කියන ඉඩම<br>7. යූ. ජී. එම්. ගාමිණී ශාන්ත මයා හිමිකම් කියන ඉඩම<br>8. ගොවිජන සේවා මධ්‍යස්ථානය<br>9. ඩබ්. ජී. ගුණතිලක මයා හිමිකම් කියන ඉඩම<br>10. ආනන්ද දොරවක මයා හිමිකම් කියන ඉඩම<br>11. බණ්ඩාර මයා හිමිකම් කියන ඉඩම<br>12. ටී. ජී. ජයවර්ධන මයා හිමිකම් කියන ඉඩම<br>13. ඩබ්. ජී. මල්ලිකා මිය හිමිකම් කියන ඉඩම<br>14. පැටී මයා හිමිකම් කියන ඉඩම<br>15. සරත් විමලධර්ම මයා හිමිකම් කියන ඉඩම<br>16. නිලංග කරුණාසේන මයා හිමිකම් කියන ඉඩම | 1. එම්. ජී. ප්‍රේමලතා මිය හිමිකම් කියන ඉඩම<br>2. එස්. ජී. ධර්මදාස මයා හිමිකම් කියන ඉඩම<br>3. ජේ. එම්. ලොකුබණ්ඩා මයා හිමිකම් කියන ඉඩම<br>4. කේ. ටී. ජී. නන්දාවතී මිය හිමිකම් කියන ඉඩම<br>5. ඒ. එච්. ඒ. කිරිබණ්ඩා මයා හිමිකම් කියන ඉඩම<br>6. ඊ. කේ. ජී. තිලකරත්න මයා හිමිකම් කියන ඉඩම<br>7. කේ. ඒ. තිලකරත්න මයා හිමිකම් කියන ඉඩම<br>8. එච්. ජී. සුනිල් කුමාර මයා හිමිකම් කියන ඉඩම<br>9. වී. ජී. එම්. මහින්දකුමාර මයා හිමිකම් කියන ඉඩම<br>10. ඩී. ඩබ්. ඒ. ජයතිලක හාමිනේ මිය හිමිකම් කියන ඉඩම<br>11. එම්. ජී. පොඩිනෝනා මිය හිමිකම් කියන ඉඩම<br>12. එම්. ජී. සුමනදාස මයා හිමිකම් කියන ඉඩම<br>13. රම්‍යලතා මිය හිමිකම් කියන ඉඩම<br>14. ඩබ්. ජී. රංජිත් විමලසේන මයා හිමිකම් කියන ඉඩම<br>15. කේ. ජී. ප්‍රසන්න ගුණතිලක මයා හිමිකම් කියන ඉඩම | 4004 B | 1420 | අවමය අඩි 15 සිට පිඹුරේ දක්වා ඇති පරිදි |

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | පිඹුරු පත් අංකය | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 17. එම්. ජී. මල්ලිකා මිය හිමිකම් කියන ඉඩම<br>18. ඩබ්. ජී. විජේසේකර මයා හිමිකම් කියන ඉඩම<br>19. එච්. ජී. කීර්තිරතන මයා හිමිකම් කියන ඉඩම | 16. ප්‍රාදේශීය සභා පුස්තකාලය<br>17. ධර්මසේන මයා හිමිකම් කියන ඉඩම<br>18. පී. ජී. ගුණපාල මයා හිමිකම් කියන ඉඩම<br>19. ආර්. ජී. කනිෂ්ක මයා හිමිකම් කියන ඉඩම<br>20. කේ. ජී. ටී. බිසෝමැණිකේ මිය හිමිකම් කියන ඉඩම | | | |




කාසල්මිල්ක් - හදබිම මාර්ගය
පිඹුරු අංකය:-4004B
ආර්.එස්.පතිරණ වරලත් මිනින්දෝරු මි.ආ.)
ලියාපදිංචි බලයලත්මිනින්දෝරු ,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
එම්. කේ. ජී. එස්. සුබසිංහ
ලේකම්
උඩපළාත ප්‍රාදේශීය සභාව
ම.මි./ආර්.එස්.පතිරණ මයාවිසින් පිළියෙල කරන ලද 4004-A දරණ පිඹුර
ගොනටුවලට
ගොනටුවල
කැසි 320035(කලාප 3)
පත්‍රය 5
යොමුව
ග : මායිම් ගල
ක : මායිම් කනුව
ඉ : ඉවුර
ආතා : ආධාරක තාප්පය
කා : කානුව
දුක : දුරකථන කනුව
වීක : විදුලි කනුව
මාර්ග(ප්‍රාස) : මාර්ගය(ප්‍රාදේශීය සභා)
පරිමාණය:- 1: 2000
මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ
දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ,
කදුකර පහල කෝරළේ
උඩපලාත ප්‍රාදේශීය සභා සීමාව තුල
1145-ගොනටුවල ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ
ගොනටුවල ගමේ පිහිටි
කාසල්මිල්ක් - හදබිම මාර්ගය
මැන පෙන්වන
පිඹුර
කැබලි අංකය | ප්‍රමාණය: හෙක්. | අ. | රූ. | ප. | කිවයුතු කරුණු
1 | 1.2048 | 2 | 3 | 36.3 | ගොනටුවල ගම මැදින් දිවෙන කාසල්මිල්ක්-හදබිම මාර්ගය(මෙම මාර්ගය සර්වේ ජනරාල් තුමාගේ අනුමැතිය පිට සකසන ලද මුපි මහ4559,මුපි. මහ4606 සහ 3671 දරණ පිඹුරුවල ඇතුලත්ව ඇත. (කි.මී. 1.42 යි)
සටහන:--/
1.) උඩපළාත ප්‍රාදේශීය සභාවේ ලේකම් ගේ අංකෙC/UPS/03/04/ හා 2023.11.
දින දරණ ලිපියේ ඉල්ලීම පරිදි මැනීම කර මෙම පිඹුර සකස් කරන ලදි.
උඩපළාත ප්‍රාදේශීය සභාවේ ලේකම්,එස්.එම්.කේ.පී.එස්.සුභසිංහ මිය සහ තාක්ෂණ නිළධාරී
යු.අයි.වීරසූරිය මිය සහ.තාක්ෂණ නිළධාරී, ටී.රණසිංහ මයා විසින් මායිම් පෙන්වා දීම සහ
බලා ගැනීම සිදු කරන ලදි.
2.) රතු පාටින්පෙන්වා ඇති මායිම් සර්වේ ජනරාල්තුමාගේ මූලික පිඹුරු අධිස්ථාපනය කිරීමෙන්
ලබාගෙන ඇත.
මැනිම කලේ : 2023 නොවැම්බර් මස 29 වන දින
ආර්.එස්.පතිරණ(සී.එස්.එස්.අයි.)
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු ,
2023.12.10
ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය
සර්වේයර්. ආර්. එස්. පතිරණ
වරලත් මිනින්දෝරු (සාමාජික අංකය : 1641)
ලියාපදිංචි අංකය : 19961044
බලයලත් මිනින්දෝරු. උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
ගොනටුවල
කැසි 320035(කලාප 6)
මාර්ගය(ප්‍රාස)
මුපි.මහ 3671
5
මිල්ලගහමුලට

# විවිධ දැන්වීම්

## මතුගම ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා සේවාවන් සැපයීම ගාස්තු සංශෝධනය කිරීම

මතුගම ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරිගේ තීරණ පොතේ තීරණ අංක 1908 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලේකම්,
මතුගම ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මතුගම ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1989-2016.10.14 දින ගැසට් පත්‍රය මගින් වැළඳගන්නට යෙදුන 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(අ) කොටස පළාත් සභා අංක 1947/6 - 2015.12.28 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ අතුරු ව්‍යවස්ථාවේ සම්මත මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එහි අතුරු ව්‍යවස්ථාවේ 4(2) අනුව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛන I තීරුවේ සඳහන් සහතිකයක් හෝ සේවාවන් සැපයීම සඳහා එම උපලේඛන II තීරුවේ ඒ ඒ සහතිකයන් හෝ සේවාවන් සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2025 වර්ෂයට පනවා අය කළ යුතු බවත්, එකී සේවාව හෝ සහතිකය ලබා ගන්නා යම් තැනැත්තෙකු විසින් ඒ සේවාව හෝ සහතිකය ලබා ගැනීමට පෙර එම ගාස්තුව මතුගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් 2025 වර්ෂයකට ගාස්තු නියම කිරීම 2023.08.28 දින තීරණ අංක 694 යටතේ ලබාගත් තීරණයට අනුව ලබාගත් මහජන ක්‍රීඩාංගනය කුලී පදනම මත සැණකෙළි සංදර්ශන, සංගීත සංදර්ශන සඳහා දිනට රු. 10,000.00 ක තැන්පත් මුදලක් ද දේශපාලන රැස්වීම් සඳහා රු. 5,000 ක තැන්පත් මුදලක් ද අය කිරීමට තීරණය කර ඇති අතර නමුත් එම මුදල ප්‍රමාණවත් නොවන එබැවින් සංගීත සංදර්ශන, සැණකෙළි, දේශපාලන රැස්වීම් හා ජනහමු සඳහා තැන්පත් ගාස්තුව පහත සඳහන් ආකාරයට සංශෝධනය කරනු ලබන බව 2024.08.01 දින තීරණ අංක 1908 යටතේ තීරණය කරමි.

| | | *I තීරුව* | *II තීරුව* | |
|---|---|---|---|---|
| | | *ක්‍රීඩාංගනයේ නම* | *ගාස්තුව රු. ශත* | *තැන්පත් මුදල රු. ශත* |
| I | **මහජන ක්‍රීඩාංගනය - මතුගම** | | | |
| | (ආ) | දේශපාලන රැස්වීම් හා ජනහමු (දිනකට) | 10,000.00 | 100,000.00 |
| | (ඇ) | සංගීත සංදර්ශන, | | |
| | | I රාජ්‍ය ආයතන | 10,000.00 | 100,000.00 |
| | | II වෙනත් ආයතන (ටිකට් සහිත) සැණකෙළි | 15,000.00 | 100,000.00 |
| | | I රාජ්‍ය ආයතන | 10,000.00 | 100,000.00 |
| | | II වෙනත් ආයතන (ටිකට් සහිත) | 20,000.00 | 100,000.00 |

09-135

## පන්නල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර පන්නල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.08.13 දිනැති අංක 7042 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. එස්. ජයසිංහ,
ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 24 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාවේ දී ය.

### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2025 වර්ෂය සඳහා බලාත්මක කරන ලද 2018 වර්ෂයේ තක්සේරුව 2025 වර්ෂය සඳහා තක්සේරුව ලෙස පිළිගත යුතු බවටත්,

එකී පනතේ 134 වගන්තියේ (1) උපවගන්තිය යටතේ එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද පන්නල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද, 2025 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%)ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල පන්නල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම්, එම කාර්තුවට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද පන්නල ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බවටත් තීරණය කරමි.

### උපලේඛනය

| *I වැනි තීරුව* *කාර්තුව* | *II වැනි තීරුව* *ගෙවිය යුතු දිනය* | *III වැනි තීරුව* *5% ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමු වන කාර්තුව | 2025.03.31 | 2025.01.31 |
| දෙවන කාර්තුව | 2025.06.30 | 2025.04.30 |
| තුන්වන කාර්තුව | 2025.09.30 | 2025.07.31 |
| හතරවන කාර්තුව | 2025.12.31 | 2025.10.31 |

09-154/1

## පන්නල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර පන්නල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.08.13 දිනැති අංක 7043 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. එස්. ජයසිංහ,
ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 24 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය යටතේ පන්නල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂය සඳහා බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2025 වර්ෂය සඳහා සත්‍යාක්ෂණය කිරීම ලෙස පිළිගත යුතු බවටත්,

එකී සත්‍යාක්ෂණය කිරීම මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූද, ඉහත කී පනතේ 135 වන වගන්තියෙන් අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ -

(*අ*) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2025 වර්ෂය සඳහා රුපියල් දහය බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(*ආ*) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත 2025 වර්ෂය සඳහා රුපියල් පනහ බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට ; සහ

(*ඇ*) එකී අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවිය යුතු බවටද,

තව ද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද පන්නල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2025 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද, පන්නල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

**උපලේඛනය**

| *I වැනි තීරුව කාර්තුව* | *II වැනි තීරුව ගෙවිය යුතු දිනය* | *III වැනි තීරුව 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමු වන කාර්තුව | 2025.03.31 | 2025.01.31 |
| දෙවන කාර්තුව | 2025.06.30 | 2025.04.30 |
| තුන්වන කාර්තුව | 2025.09.30 | 2025.07.31 |
| හතරවන කාර්තුව | 2025.12.31 | 2025.10.31 |

09-154/2

## පන්නල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට ප්‍රචාරක දැන්වීම්, දෘශ්‍ය පරිසරය පිළිබඳව ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර පන්නල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම්, දෘශ්‍ය පරිසරය පිළිබඳව ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.08.13 දිනැති අංක 7044 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. එස්. ජයසිංහ,
ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 24 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 22 සහ 122, 126 යන වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරන IV (ආ) අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළාත් පාලන කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි ඡේදය යටතේ පන්නල ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මෙහි පහත උපලේඛනයේ සඳහන් මුදලක් පන්නල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

**උපලේඛනය**

| | | *රු. ශත* |
|---|---|---|
| 1. | තාවකාලික ස්වභාවයේ ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් මාසයක් (දින 30) හෝ ඊට අඩු කාලයක් ප්‍රදර්ශනය කිරීම සඳහා මසකට වර්ග අඩියකට | 30 0 |
| 2. | ඉඩම් කට්ටි කිරීම සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් මාසයක් (දින 30) හෝ ඊට අඩු කාලයක් ප්‍රදර්ශනය කිරීම සඳහා මසකට වර්ග අඩියකට | 100 0 |
| 3. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 200 0 |
| 4. | මාස 03 කට අඩු කාල සීමාවක් සඳහා ප්‍රදර්ශනය කරනු ලබන බිම සිටුවන ලද තහඩු බෝඩ් හෝ ඩිජිටල් බෝඩ් සඳහා වර්ග අඩියකට | 100 0 |
| 5. | මාස 03කට වැඩි කාලයක් සඳහා ප්‍රදර්ශනය කරනු ලබන බිම සිටුවන ලද තහඩු බෝඩ් හෝ ඩිජිටල් බෝඩ් සඳහා (පළමු වර්ෂයට වර්ග අඩි 1ට) | 100 0 |
| 6. | මාස 03ට වැඩි කාලයක් සඳහා ප්‍රදර්ශනය කරනු ලබන බිම සිටුවන ලද තහඩු බෝඩ් හෝ ඩිජිටල් බෝඩ් සඳහා (පළමු වර්ෂයට පසුව වර්ෂයකට වර්ග අඩි 1ට) | 50 0 |

09-154/3

---

## පන්නල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ඝණ අපද්‍රව්‍ය බැහැරලීමේ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර පන්නල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ඝන අපද්‍රව්‍ය බැහැරලීමේ ගාස්තු නියම කිරීම පහත සඳහන්

ආකාරයට විය යුතු බවට 2024.08.13 දිනැති අංක 7045 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. එස්. ජයසිංහ,
ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 24 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වන වගන්තිය හා 126 වන වගන්තියෙන් පන්නල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක හෝ පන්නල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ කාර්යය සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ගාස්තුවක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් තීරණය කරමි.

**උපලේඛන අංක 01**

| *I වැනි තීරය* | *II වැනි තීරය* <br> *රු. ශත* |
|---|---|
| 01. වීථියකට හෝ මංමාවතකට යාබදව පිහිටි ගසක් හෝ ගසක කොටසක් කපා ඇති විටක එය ඉවත් කිරීම සඳහා (ට්‍රැක්ටර් ලෝඩ් එකක් සඳහා) | 2,000 0 |
| 02. නිවාස පරිශ්‍රයන්වලින් බැහැර කරන සතුන්ගේ මළකුණු, ශරීර කොටස් ඉවත් කිරීම සඳහා | 4,500 0 |
| 03. සාප්පු සහ කාර්යාල පරිශ්‍ර ඇතුගැමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගාස්තුව (තොග සහ සිල්ලර වෙළඳාම, ආහාරපාන අලෙවිය, ආහාරපාන නිෂ්පාදනය, වාහන සේදුම් සේවා, ටයර් ටියුබ් වැඩපොළ බාබර් සාප්පු, රූපලාවන්‍ය සැලෝන්) - වාර්ෂිකව | 1,000 0 |
| 04. පදික වෙළඳාම හෝ සංචාරක වෙළඳාම නිසා ජනනය වන අපද්‍රව්‍ය (උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) සඳහා ගාස්තුව වාර්ෂිකව | 600 0 |
| 05. කර්මාන්ත ශාලා මගින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය සඳහා ට්‍රැක්ටර් ලෝඩ් එකකට (උපරිම ට්‍රැක්ටර් ලෝඩ් ගණන දහයකි) | 5,000 0 |
| 06. කාබනික පොහොර නිෂ්පාදනයට යොදාගන්නා එළවළු, ඉඳුල් වැනි ඉවතලන ද්‍රව්‍ය සඳහා ට්‍රැක්ටර් ලෝඩ් එකකට - මසකට | 2,000 0 |
| 07. කැනීම්, ඉදිකිරීම් හා කඩා දැමීම් මගින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය සඳහා (ට්‍රැක්ටර් ලෝඩ් එකක් සඳහා පැටවුම් ගාස්තු හැර ප්‍රවාහනය සඳහා පමණක්) | 5,000 0 |
| 08. රජයේ ආරෝග්‍ය ශාලා පරිශ්‍රය අතුගැමෙන් එකතුවන දූවිලි හා වෙනත් වියළි ද්‍රව්‍ය (සායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) සඳහා වාර්ෂික ගාස්තුව (පැටවුම් ගාස්තු හැර) | 2,000 0 |
| 09. පෞද්ගලික රෝහල් හා රසායනාගාර පරිශ්‍රය ඇතුගැමෙන් පසු එකතු වන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය (සායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය හැර) සඳහා වාර්ෂික ගාස්තුව | 3,000 0 |
| 10. වෙනත් පරිශ්‍රවලින් ඉවත් කරන කසළ සඳහා වාර්ෂික සේවා ගාස්තුව (ඉහත සඳහන් කර නොමැති ව්‍යාපාර) | 1,000 0 |
| 11. දියර පොහොර - ලීටර් 01 | 100 0 |
| 12. කොම්පෝස්ට් පොහොර - 1kg | 20 0 |

09-154/4

## පන්නල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර පන්නල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වාහන හා සත්ත්ව බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.08.13 දිනැති අංක 7046 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. එස්. ජයසිංහ,
ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 24 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර පන්නල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකුම එහි II වැනි තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ත්ව බද්දක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී වාහන හා සත්ත්ව බද්දට යටත් තැනැත්තකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| | *රු. ශත* |
| (1)(i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් සයිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| (ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා - | |
| (අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| (iii) සෑම කරත්තයක් සඳහා | 20 0 |
| (iv) සෑම අත්කරත්තයක් සඳහා | 10 0 |
| (v) සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| (vi) සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා | 15 0 |
| (vii) සෑම ඇතෙකු සඳහා | 50 0 |

(2) විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

09-154/5

## පන්නල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සුසානභූමි හා මිනීපිටි ආඥාපනත යටතේ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර පන්නල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව සුසාන භූමි හා මිනීපිටි ආඥාපනත යටතේ ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.08.13 දිනැති අංක 7047 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. එස්. ජයසිංහ,
ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 24 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

231 වන අධිකාරය වන සුසාන භූමි හා මිනී පිටි ආඥාපනතේ 3 වැනි වගන්තියේ හා 17 සිට 22 දක්වා වගන්ති අනුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සහා බලප්‍රදේශය තුළ ඇති ප්‍රාදේශීය සභාවට අයත් සුසානභූමිවල තැන්පත් කිරීමක් හෝ ස්මාරකයක් ඉදිකිරීම සඳහා 2025 වර්ෂයට පහත පරිදි ගාස්තු පනවා අය කිරීමට තීරණය කරමි.

1. සුසාන භූමියේ මෘත දේහයක් තැන්පත් කිරීම සඳහා වර්ග අඩි එකකට රු. 2,000 බැගින් (උපරිම අඩි 3 x අඩි 7)
2. සුසාන භූමියේ ස්මාරකයක් තැනීම සඳහා පාදම වර්ග අඩි එකකට රු. 2,000 බැගින් (උපරිම අඩි 2 x අඩි 2) හා ස්මාරකයේ උස දික් අඩි එකක් සඳහා රු. 3,000 බැගින්.

09-154/6

---

## පන්නල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර පන්නල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව සුසාන භූමි හා මිනීපිටි ආඥාපනත යටතේ ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.08.13 දිනැති අංක 7048 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. එස්. ජයසිංහ,
ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 24 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149 වන වගන්තිය යටතේ වන බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක හෝ පන්නල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පන්නල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2025 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2025 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටද තීරණය කරමි.

**උපලේඛනය අංක 01**

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | *බලය දෙනු ලබන කාර්යය* | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| අප්‍රසන්න ව්‍යාපාර : | | | | |
| 1. | මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | සම් පදම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | සම් විකිණීමට තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | සත්ත්ව පාලනය (මස්, බිත්තර හෝ කිරි සඳහා) | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | උම්බලකඩ නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම | 500 0 | 700 0 | 1,000 0 |
| 8. | පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේළීම හෝ අයිස් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | දුම්කොළ වියළීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සත්ත්ව ආහාර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පුන්නක්කු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සබන් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ට්‍රන්ක් පෙට්ටි සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ලෝහ සුන්බුන් තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ගෘහ භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වේවැල් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | සිරප් හෝ පළතුරු බීම නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | රස කැවිලි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම) | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර) | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | දත් බුරුසු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | රා එකතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | විනාකිරි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | දැව ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | සෝඩා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | කෙඳි සායම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | සම් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | කෝපි, ධාන්‍ය වර්ග ටින්වල ඇසිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | බේකින් පවුඩර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| *බලය දෙනු ලබන කාර්යය* | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 40. ගෑස් මැන්ටල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. පොටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. ඉටිපන්දම් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. කපුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. රෙදි සෝදන නිල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. ලාකඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. සුවඳ විලවුන් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. පාසල් රටහුණු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. ටයර් හෝ ටියුබ් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. ටයර් නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. ටයර් ටියුබ් වොල්කනයිස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. සිමෙන්ති නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. වැලි කඩදාසි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. ගඩොල් පිලිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇතිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. උළු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. පොහොර, හුණුපිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කොට විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

**උපලේඛනය අංක 2**

**අන්තරාදායක ව්‍යාපාර :**

| | | | |
|---|---|---|---|
| 1. කළුගල් කැනීම හෝ කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. එළවළු තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 3. පොල්තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. තේ පෙට්ටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. පිදුරු තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. යන්ත්‍රාණුසාරයෙන් ලී ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|
| *බලය දෙනු ලබන කාර්යය* | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 13. හිරිගල් හෝ හුණු ගල් කැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. විසිරි පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. ගිනිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

